Remove Watermark Now

# ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය

පළමු වාර පරීක්ෂණය - 2019 මාර්තු

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I, II

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය II

11 ශ්‍රේණිය　　　　කාලය පැය 03 යි

සැලකිය යුතුයි :

- පළමුවන ප්‍රශ්ණය ඇතුළුව I කොටසෙන් ප්‍රශ්න දෙකක්ද II කොටසෙන් ප්‍රශ්න දෙකක් ද බැගින් තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

---

01. පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් අංක (I) සිට (X) දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

උද්‍යාන අලංකරණයට යොදාගන්නා ශාක පිළිබඳ පාඨමාලාවක් හැදෑරූ මියුරු විසිතුරු පත්‍රික ශාක සහ මල්පැළ සකස් කර අලෙවි කිරීමේ ව්‍යාපාරයක් ''මියුරු ගාර්ඩන්ස්'' නමින් පවත්වාගෙන යනු ලබයි. 2019 ජනවාරි 01 දිනට මෙම ව්‍යාපාරයේ පැවති වත්කම් හා වගකීම් පහත දැක්වේ.

| | (රු.) |
|---|---|
| මුදල් | 48,000 |
| 12% බැංකු ණය | 50,000 |
| ඉඩම් ගොඩනැගිලි | 150,000 |
| ලී බඩු උපකරණ | 15,000 |
| කෘෂි උපකරණ | 34,000 |
| මල් පැළ තොගය | 23,000 |
| ණය හිමියෝ | 35,000 |
| ණයගැතියෝ | 30,000 |

ජනවාරි මාසය තුල සිදුවූ ගනුදෙනු පහත දැක්වේ.

| | |
|---|---|
| මල්පෝච්චි මිලදී ගැනීම | 10,000 |
| කොම්පෝස්ට් හා රසායනික පොහොර සඳහා | 18,000 |
| පොලිතීන් කවර සඳහා | 4,000 |
| අත් උදව්කරුගේ වැටුප | 12,000 |
| මල් පැල ප්‍රවාහන කුලිය | 36,000 |
| අත්පිට විකුණුම් | 80,000 |
| ණයට විකුණුම් | 44,000 |
| පොළිය රු.500 ක් ඇතුළුව බැංකු ණය වාරික ගෙවීම | 5,500 |

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් පැවැත්වූ මල් පැල ප්‍රදර්ශනයකට මියුරු ද සහභාගී වූ අතර එදින හඳුනාගත් දේශීය විදේශීය ගැනුම්කරුවන්ගෙන් මේ වනවිට ඇණවුම් ලැබී ඇත. තවද ප්‍රදර්ශන භූමියේදී මියුරු සමස්ත ලංකා මල්පැළ අලෙවිකරුවන්ගේ සංගමයේ සාමාජිකත්වය ද ලබාගෙන ඇත. ප්‍රදර්ශන සඳහා සහභාගී වීමේදී අළෙවි කුටියේ ප්‍රදර්ශනය කිරීම සඳහා ආකර්ශණීය බැනරයක් මුද්‍රණය සඳහා ආයතනයකට භාර දී ඇති මියුරු කුඩා ලොරි රථයක් ද මිලදී ගැනීමට තීරණය කර ඇත. මල් පැළ සඳහා ඉල්ලුම දිනෙන් දින ඉහළ යන බැවින් 2019 ජනවාරි 31 දින රු.20,000 ක මාසික වැටුපකට සේවකයෙකු ද බඳවා ගන්නා ලදි.

(i) (අ) මියුරු ගාර්ඩන්ස් ව්‍යාපාරය අයත්වන ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක්ද?

(ආ) සිද්ධියේ සඳහන්, ලාභ අරමුණු කර නොගත් ව්‍යාපාර සංවිධාන සඳහා නිදසුන් දෙකක් ලියන්න.

(ii) (අ) මෙම ව්‍යාපාරයේ දැකිය හැකි ශක්තියක් හා අවස්ථාවක් ලියන්න.
(ආ) විදේශීය ඇණවුම් සඳහා මල් පැල සැපයීම කුමන වෙළෙඳාම ලෙස හැඳින්වේද ?

(iii) (අ) මෙම ව්‍යාපාරයේ අභ්‍යන්තර පරිසරයට අයත් ඇල්මැති පාර්ශව දෙකක් නම් කරන්න.
(ආ) කොම්පෝස්ට් පොහොර කුමන නිෂ්පාදන සාධකයට අයත් වේද ?

(iv) (අ) ඉහත සිද්ධිය ඇසුරෙන් සැලසුම්කරණ කාර්යය සහ සංවිධානකරණ කාර්යය සඳහා නිදසුන බැගින් දක්වන්න.
(ආ) ප්‍රචාරක බැනරය අලෙවි මිශ්‍රයේ කුමන විචල්‍යයට අයත්ද ?

(v) (අ) 2019 ජනවාරි 01 වන දිනට මෙම ව්‍යාපාරයේ හිමිකම කොපමණද ?
(ආ) 2019 ජනවාරි 01 දිනට ජංගම වත්කමක් හා ජංගම වගකීමක් අගයන් සහිතව ලියා දක්වන්න.

(vi) බැංකු ණය පොළිය ගිණුම්ගත කිරීමට අදාල ද්විත්ව සටහන ලියන්න.

(vii) මුදල් ගිණුම පිළියෙල කර 2019 ජනවාරි 31 දිනට ශේෂය දක්වන්න.

(viii) මෙම ව්‍යාපාරය භාවිතා කරන මූලික පොත් 2 ක් නම් කරන්න.

(ix) (අ) ජනවාරි මාසයේ මුළු විකුණුම් කොපමණද ?
(ආ) 2019.01.31 දිනට ණයගැති ශේෂය කොපමණද ?

(x) මෙම ව්‍යාපාරය ජනවාරි මාසය සඳහා රු. 41,000 ක ශුද්ධ ලාභයක් ලබා ඇත. ඒ අනුව, 2019 ජනවාරි 31 දිනට ප්‍රාග්ධනය කොපමණද ? (ලකුණු 20)

## I කොටස – ව්‍යාපාර අධ්‍යයනය

02. (i) (අ) ව්‍යාපාරයක් යනු කුමක්ද?
(ආ) මිනිස් අවශ්‍යතා හා වුවමනා අතර වෙනස්කම් දෙකක් ලියන්න.

(ii) පහත දක්වෙන ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.
(අ) ජාතික ඉතිරි කිරීමේ බැංකුව සේවා සපයන ව්‍යාපාරයකි.
(ආ) ව්‍යාපාරයට සම්පත් සපයන පුද්ගලයෝ කළමනාකරුවෝ ය.
(ඉ) නැවත විකිණීමේ පරමාර්ථයෙන් භාණ්ඩ මිලදී ගන්නන් පාරිභෝගිකයන් ලෙස හඳුන්වයි.
(ඊ) රටක අයවැය ප්‍රතිපත්ති දේශපාලන පරිසරයට අයත් සාධකයකි.

(iii) නිසල් නවීන ක්‍රම ශිල්ප භාවිතා කරමින් පාවහන් අලුත්වැඩියා කිරීමේ ව්‍යාපාරයක් ''ෂූ කෙයා'' නමින් පවත්වාගෙන යනු ලබයි.
(අ) මෙම ව්‍යාපාරය මගින් සපුරාලන මූලික මිනිස් අවශ්‍යතාව කුමක් ද?
(ආ) ''ෂූ කෙයා'' ව්‍යාපාර නාමය ලියාපදිංචි කළ යුතුද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

(iv) පලතුරු වගාකරුවන්ගෙන් නැවුම් පළතුරු මිලදී ගන්නා නදිනි ඒවායින් පලතුරු බීම සකස් කර පාසල් සිසුන්ට අලෙවි කරයි.
(අ) පලතුරු බීම සඳහා යොදා ගන්නා නැවුම් පලතුරු කුමන නිෂ්පාදන සාධකයට අයත් ද?
(ආ) නදිනිගේ ව්‍යාපාරය කෙරෙහි උනන්දුවක් දක්වන බාහිර පරිසරයට අයත් පාර්ශවයක් නම් කර උනන්දුවක් දැක්වීමට හේතුවක් ලියන්න.

(ලකුණු 08)

3. (i) (අ) තොග වෙළඳාම යනු කුමක්ද?
(ආ) වාණිජ බැංකුවක් යන්න කෙටියෙන් හඳුන්වන්න.

(ii) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.
(අ) ජංගම ගිණුම් තැන්පතු සඳහා පොලියක් හිමි නොවේ.
(ආ) ණය කාඩ්පත් ලබා ගැනීම සඳහා ගනුදෙනුකරුට බැංකු ගිණුමක් තිබීම අවශ්‍ය නොවේ.
(ඉ) හානිපූර්ණ මූලධර්මය ජීවිත රක්ෂණයට අදාළ වේ.
(ඊ) චෙක්පත නිකුත් කළ පසු චෙක්පොතෙහි ඉතිරිවන කොටස ලදුපත ලෙස හඳුන්වයි.

Remove Watermark Now

(iii) නුවරඑළියේ සිට කොළඹ දක්වා දුම්රියෙන් ප්‍රවාහනය කළ එළවළු තොගය තම වෙළෙඳසැල දක්වා ගෙන යාමට දීපාල් ට කුඩා ලොරියක් යොදා ගැනීමට සිදු විය.

(අ) මාර්ගය හා මාධ්‍ය යන ප්‍රවාහන මූලිකාංග සඳහා ඉහත සිද්ධියට අදාළව නිදසුන් දෙක බැගින් ලියන්න.

(ආ) සිද්ධියේ දැක්වෙන පරිදි දුම්රිය ප්‍රවාහනයේ දී ඇති වූ අවාසියක් නම් කරන්න.

(iv) ලංකා බැංකුවෙන් ණය මුදලක් අයදුම් කළ රේඛාට එම ණය මුදල අනුමත වී ඇති බව ලිපියකින් දැනුම් දී ඇත.

මෙම සිද්ධියේ සඳහන් සන්නිවේදන ක්‍රියාවලියට අදාල යවන්නා, පණිවිඩය, මාධ්‍ය හා ලබන්නා වෙන වෙනම ලියා දක්වන්න.

(ලකුණු 08)

04. (1) සංවිධානයක අරමුණු ඉටුකර ගැනීම සඳහා සම්පත් **<u>කාර්යක්ෂමව</u>** හා **<u>සඵලදායීව</u>** යොදා ගැනීම කළමනාකරණය යි.

ඉහත ප්‍රකාශයේ ඉරි ඇඳි පද කෙටියෙන් පැහැදිලි කරන්න.

(ii) පහත දැක්වෙන ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

(අ) ආයතනයක් තුළ විවිධ මාධ්‍ය භාවිතා කර තොරතුරු, පණිවිඩ හුවමාරු කරගැනීම බාහිර සන්නිවේදනය යි.

(ආ) කළමනාකරණ කාර්යයක් වන පාලනය තුළින් සිදු කෙරෙන්නේ ව්‍යාපාර කටයුතු සැලසුම් කළ ආකාරයෙන් සිදුවේද යන්න සොයා බැලීම පමණි.

(ඉ) භාණ්ඩයකට සාධාරණ මිලක් ලකුණු කිරීම අලෙවිකරණයට අයත් කාර්යයකි.

(ඊ) නිෂ්පාදකයා විසින්ම පාරිභෝගිකයාට තම නිෂ්පාදිත බෙදාහැරීම ඍජු බෙදා හැරීම ලෙස හඳුන්වයි.

(iii) (අ) ''නිෂ්පාදිත'' යන්න කෙටියෙන් හඳුන්වන්න.

(ආ) භාණ්ඩ බෙදා හැරීමේ ක්‍රියාවලියේ අතරමැදියන් දෙදෙනෙකු නම් කරන්න,

(iv) ජෑම් නිෂ්පාදන ආයතනයක් නැවුම් පළතුරු පමණක් යොදාගෙන ගුණත්වයෙන් ඉතා ඉහළ ජෑම් නිෂ්පාදනය කරන අතර නිෂ්පාදන ක්‍රියාවලියේ සෑම අවස්ථාවක දීම තත්ත්ව පාලක විසින් ජෑම්වල ගුණත්වය පරීක්ෂා කර බලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලබයි. මෙම නිෂ්පාදිතය පිළිබඳ පාරිභෝගිකයා දැනුවත් කිරීමට රූපවාහිනී දැන්වීමක් ප්‍රචාරය කිරීමට ද තීරණය කර ඇත.

අලෙවි මිශ්‍රයේ විචල්‍යයන් දෙකක් සහ කළමනාකරණයේ කාර්යයන් දෙකක් නම් කර ඉහත සිද්ධිය ඇසුරෙන් නිදසුන් දක්වන්න.

(ලකුණු 08)

## II කොටස - ගිණුම්කරණය

05. (i) (අ) ද්විත්ව සටහන් ක්‍රමය කෙටියෙන් හඳුන්වන්න.

(ආ) ව්‍යාපාරයක අයිතිකරුගේ හිමිකම අඩු වීමට බලපාන කරුණු දෙකක් ලියන්න.

(ලකුණු 02)

(ii) ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහා රු.25,000 ක් වටිනා ලී බඩු 2019.01.08 දින විජය සමාගමෙන් ණයට ලබා ගැනීම. අවශ්‍ය වන්නේ,

- ඉහත දැක්වූ ගනුදෙනුව අදාළ මූලික පොතේ සටහන් කිරීම.

(ලකුණු 02)

(iii) සචිනිගේ ව්‍යාපාරයේ 2019 ජනවාරි මාසයේ සිදුවූ ගනුදෙනු කිහිපයක් පහත දක්වේ.

| | | |
|---|---|---|
| 1. | සචිනි අමතර ප්‍රාග්ධනය යෙදවීම | - රු.10,000 |
| 2. | ණය ගැතියන්ගෙන් මුදල් ලැබුණා | - රු.6,000 |
| 3. | බැංකු ණය ලබා ගැනීම | - රු.50,000 |
| 4. | මාසික ගොඩනැගිලි කුළී ගෙව්වා | - රු.15,000 |
| 5. | බඩු තොගයක් ණයට ගැනීම | - රු.8,000 |

Remove Watermark Now

අවශ්‍ය වන්නේ,

(අ) ඉහත ගනුදෙනු ගිණුම්කරණ සමීකරණයට බලපාන ආකාරය දැක්වීම. (පිළිතුරු සැපයීමට මෙම ආකෘතිය භාවිතා කරන්න .)

| ගනුදෙනුව | වත්කම් | = | හිමිකම් | + වගකීම් |
|---|---|---|---|---|
| 2019-01-01 දිනට ශේෂය | 100,000 | | 75,000 | 25,000 |
| 1 | | | | |
| 2 | | | | |
| 3 | | | | |
| 4 | | | | |
| 5 | | | | |

(ආ) 2019 ජනවාරි 31 දිනට වත්කම් = හිමිකම් + වගකීම් යන ගිණුම් සමීකරණය පවතින ආකාරය දක්වන්න.

(iv) පහත දැක්වෙන ගනුදෙනු මුදල් පොතක සටහන් කර 2019 ජනවාරි 31 දිනට ශේෂය දක්වන්න.

| දිනය | ල/අ | ව/අ | විස්තරය |
|---|---|---|---|
| 2019-01-01 | 01 | - | අයිතිකරු ව්‍යාපාරයට මුදල් යෙදවීම රු.75,000 |
| 2019-01-08 | - | 01 | අත්පිට මුදලට ලී බඩු මිලදී ගැනීම රු.20,000 |
| 2019-01-14 | 02 | - | බැංකු ණය ලබා ගැනීම රු. 50,000 |
| 2019-01-23 | - | 02 | වෙළෙඳ භාණ්ඩ තොගයක් මිලදී ගැනීම රු.25,000 |
| 2019-01-28 | - | 03 | ගොඩනැගිලි කුලී ගෙවීම රු.12,000 |

(ලකුණු 04)

06. (i) (අ) ශේෂ පිරික්සුම යනු කුමක්ද?

(ආ) ලද වට්ටම් යන්න කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 02)

(ii) (අ) ගැණුම් ජර්නලයේ සටහන් කළ තොරතුරු ලෙජරයට පිටපත් කිරීමට අදාළ ද්විත්ව සටහන ලියන්න.

(ලකුණු 02)

(iii) පහත දැක්වෙන්නේ 2018 අගෝස්තු මාසය සඳහා ව්‍යාපාරයක් පිළියෙල කළ බැංකු ගිණුම හා එම මාසයට අදාළ බැංකු ප්‍රකාශනය යි.

**<u>බැංකු ගිණුම</u>**

| දිනය | ල.අ. | විස්තරය | ස/පි | වටිනාකම | දිනය | ව/අ | විස්තරය | ස/පි | වටිනාකම |
|---|---|---|---|---|---|---|---|---|---|
| 8/01 | - | ශේ/ ඉ/ගෙ | | 40500 | 8/14 | 1 | රක්ෂණ ගාස්තු 78014 | | 8,000 |
| 8/12 | | චෙක් තැන්පත් 71127 | | 12,000 | 8/21 | 2 | වේතන 78015 | | 22,000 |
| 8/20 | | චෙක් තැන්පත් 3163 | | 8,500 | | | | | |
| 8/26 | | මුදල් තැන්පත් | | 9,000 | | | | | |
| | | | | | 8/31 | | ශේ/ප/ගෙ | | 40,000 |
| | | | | 70,000 | | | | | 70,000 |

pdfelement papers.lk

Remove Watermark Now

## බැංකු ප්‍රකාශනය

| දිනය | විස්තරය | හර (රු.) | බැර (රු.) | ශේෂය (රු.) |
|---|---|---|---|---|
| 08/01 | ශේෂය | - | - | 40,500 |
| 08/15 | චෙක් තැන්පත් - 71127 | - | 12,000 | 52,500 |
| 08/16 | 78014 | 8,000 | - | 44,500 |
| 08/23 | සෘජු ප්‍රේෂණ | - | 9,600 | 54,100 |
| 08/26 | මුදල් තැන්පත් | - | 9,000 | 63,100 |
| 08/29 | ස්ථාවර නියෝග (රක්ෂණ ගාස්තු) | 4,500 | - | 58,600 |
| 08/30 | බැංකු ගාස්තු | 600 | | 58,000 |

අවශ්‍ය වන්නේ,

(අ) 2018 අගෝස්තු 31 දිනට බැංකු ගිණුමේ ශේෂය සංශෝධනය කිරීම.

(ආ) 2018 අගෝස්තු 31 දිනට බැංකු සැසඳුම් විස්තරය (ලකුණු 04)

(iv) නදීගේ ව්‍යාපාරයේ 2018/12/31 දිනට පිළියෙල කළ ශේෂ පිරික්සුමේ හර පැත්තේ එකතුව රු.14,700/- ක් අඩු විය. පසුව සොයා බැලීමේදී පහත ගිණුම්කරණ වැරදි සිදුවී ඇති බව අනාවරණය විය.

1. රු.8,000 ක ගැණුම් ඉන්වොයිසියක් ගිණුම් පොත්වල දෙවරක් සටහන් වීම.
2. රු.5,200 ක විදුලි ගාස්තු, විදුලි ගාස්තු ගිණුමට රු. 2,500 ක් ලෙස සටහන් කිරීම.
3. රු.6,000 ක ගෙවල් කුලී මුදල් පොතේ නිවැරදිව සටහන් කර ගෙවල් කුලී ගිණුමේ බැරට සටහන් කර තිබීම.

අවශ්‍ය වන්නේ,

1. ඉහත වැරදි නිවැරදි කිරීමට අවශ්‍ය ජර්නල් සටහන්
2. අවිනිශ්චිත ගිණුම පිළියෙල කිරීම. (ලකුණු 04)

07. (i) (අ) පොදු ජර්නලයේ සටහන් කෙරෙන ගනුදෙනු දෙකක් ලියන්න.

(ආ) පරිගණක ආශ්‍රිත ගිණුම්කරණයේ වාසි දෙකක් ලියන්න.

(ලකුණු 02)

(ii) පහත දැක්වෙන්නේ වට්ටම් තීර සහිත මුදල් පොතකි.

| දිනය | ල/අ | විස්තරය | වට්ටම් (රු.) | මුදල් (රු.) | දිනය | ව/අ | විස්තරය | වට්ටම් (රු.) | මුදල (රු.) |
|---|---|---|---|---|---|---|---|---|---|
| 5/1 | | ශේෂයඉ/ගෙ | - | 13,000 | 5/6 | | ගැනුම් | | 6,000 |
| 5/8 | | මලිති | 400 | 15,600 | 5/12 | | හර්ෂි | 300 | 11,700 |
| 5/14 | | විකුණුම් | | 30,000 | 5/19 | | මලින්ද | 500 | 9,500 |
| 5/20 | | සුරංග | 200 | 7,800 | 5/31 | | ශේෂය ප/ගෙ | | 39,200 |
| | | | | 66,400 | | | | | 66,400 |

papers.lk
pdfelement

අවශ්‍ය වන්නේ,

1. දුන් වට්ටම් සහ ලද වට්ටම් ගිණුම් පිලියෙල කිරීම.
2. 5/1 දිනට මලිතිගේ ගිණුමේ ඉ/ගෙ ශේෂය රු.18,000 කි. එදිනට, හර්ෂිගේ ගිණුමේ ඉ/ගෙ ශේෂය රු.15,000 කි. මලිතිගේ හා හර්ෂිගේ ගිණුම් පිලියෙල කරන්න. (ලකුණු 04)

(iii) සමාධිගේ ව්‍යාපාරයේ සුළු මුදල් අග්‍රිමය රු.2,500 කි. 2019 ජනවාරි 01 දින අග්‍රිමය ලැබුණි. ජනවාරි මාසයේ සුළු මුදල් ගෙවීම් තොරතුරු පහත දක්වේ.

| **දිනය** | **ව/අ** | **විස්තරය** | **මුදල (රු.)** |
|---|---|---|---|
| 01/01 | 1 | ගමන් වියදම් | 200 |
| 01/02 | 2 | සංග්‍රහ වියදම් | 150 |
| 01/08 | 3 | හාෆ්ෂීට් කොළ මිලදී ගැනීම | 250 |
| 01/14 | 4 | ත්‍රීවිල් ගාස්තු | 300 |
| 01/17 | 5 | සීනි තේ කොළ සඳහා | 200 |
| 01/20 | 6 | සිසිරට ගෙවීම | 300 |
| 01/27 | 7 | පිරිසිදු කිරීම සඳහා | 150 |
| 01/28 | 8 | පෑන් සහ ෆයිල් කවර | 250 |

02/01 වියදම් ප්‍රතිපූර්ණය කළා.

අවශ්‍ය වන්නේ,

(අ) ගමන්, සංග්‍රහ, ලිපි ද්‍රව්‍ය, වෙනත්, සහ ලෙජර් තීර ඇතුලත්ව, සුළු මුදල් පොත පිලියෙල කිරීම.

(ආ) 2019/02/01 දින සුළු වියදම් ප්‍රතිපූර්ණය කිරීම

(ලකුණු 06)

papers.lk